# මේ තරුණ පිරිසේ වෑයම ප්‍රශංසනීයයි

පසුගිය 13 වැනිදා Over newton college හි රංගන ශාලාවේ පැවති youth chanty concert නැරඹීමට ප්‍රේක්ෂකයෝ අතිවිශාල ප්‍රමාණයක් පැමිණ සිටියෝය. මෙම ප්‍රසංගයේ ප්‍රධානම අරමුණ වී තිබුනේ පසුගිය වසරේ නොවැම්බර් මස 05 වැනිදා අප අතහැර ගිය නුවන් ලක්ෂාන් අමරකෝන් පුතුනුවන් සිහි ගැන්වීමත් ඔහු වෙනුවෙන් ඔහුගේම සෙහොයුරු සොහොයුරියන්ගේ හදවත් තුල ඇතිවු උදාර චේතනාවක් මල්ඵල ගැන්වීමත්ය. විශේෂයෙන්ම මෙහි මුලිකත්වය ගෙන කටයුත කල විනුශා දුවටත්, නුවන්ග පුතාටත් අනේකවාරයක් ස්තූතිවන්ත වන අතර සංවිධාන කටයුතුවල නියැලුනු අනෙකුත් දූ පුතුන්ටද අපගේ හෘදයාංගම ස්තූතිය හිමි වේ.

මුදල මුලිකවු සමාජයක, යුතු අයුතුකම් , සහෝදරකම් කල්‍යාණ මිතුදම් ගිලිහී යන සමාජයක, එමෙන්ම වැඩිහිටි දෙමාපිය යුතුකම් පැහැර හරින යුගයක ඒකඉරදඅබ හි තරුණ දූ පුතුන්ගේ පරමාදර්ශී මහැගි ක්‍රියාදමය ඇගැයීමට ලක්වන්නේ මහත් වු ආඩම්බරයෙනි. ඕස්ට්‍රේලියාව වැනි බටහිර සමාජ සංස්කෘතියක් ඇති රටක හැදී වැඩි යෞවනත්වයට පා තබන දරුවනි ඔබ, ඔබෙන් සිදුවිය යුතු යුතුකම් කෘතගුණ සැලකීම මෙම ප්‍රසංගයේදී මනාව පෙන්නුම් කලෝය. සත්තකින්ම මෙම ප්‍රසංගය වචනයේ පරිසමාර්ථයෙන්ම විවිධ ප්‍රසංගයක් වුයේය. ඊට හේතුව ශ්‍රී ලාංකික පසුබිමක් ඇති දරුවන්, ඉන්දියානු සම්බවයක් ඇති දරුවන් මෙන්ම අනෙකුත් ජාතීන්ට උරුමකම් පාන දරුවන්ගේ සංකලනයක් වීමයි.

මෙහි ආ සියලුම අංගයන් තුලින් බහුසංස්කෘතියක් නියෙර්ජනය වුවායැයි කිවහොත් මා වැරදිය. මිනිසකු අධ්‍යාපනයට පමණ පිරිපුන් මිනිසකු කිරීමට නොහැකි බව තරුණ ඔබ මෙම ප්‍රසංගයේදී මනාව පෙන්නුම් කලෝය. මොනයම් සමාජයක හෝ ජීවත්වීමට අධ්‍යාපනය මෙන්ම බටහිර ක්‍රියාකාරකම් ක්‍රීඩා, සංගීතය, වාදනය, නැටුම් කලාව, නාට්‍ය කලාව, ජීවිතයට ඇතුලු කරගන්නා දරුවන් ජීවිතය දකිනුයේ ගුණාත්මක සමාජශීලිත්වයක් කැටිවු පරමාදර්ශි නුවනින්ය. මෙම විවිධ ප්‍රසංගයේ සියලුම සංවිධාන කටයුතු මුල සිට, අග දක්වාම සිදුවුයේ තරුණ දූ පුතුන්ගේ සුරතින්ය. කථනය, වේදිකාව නිර්මාණය, වේදිකාව පිටුපස සංවිධානාත්මක කටයුතු ආලෝකය, සැපයීම කාර්මීකරණය ආදී සියලු දේ ඉටුකලේ ඔවුන්ය. කුහුඹු රැළක් මෙන්, කඩිසරව එකමුතුව කටයුතු කර තරුණ ඔබ දෙස ප්‍රේක්ෂක අප සැම නෙත් යොමා සිටියේ පිරිපුන් අනාගතයක සුභ දසුනක් ලෙසය. මෙම ප්‍රසංගයේ ඔබ නෙලාගත් ඵලය ඔබ ජීවිතවලට ආශිර්වාදත්මක ඵලයක් බවට පත්වනු නොවනුමානය. ප්‍රසංගය නරඹන අතරවාරයේ මා සිතට සිහින් ආඩම්බරයක් බලාපොරොත්තුවක් හදවතේ කොණක රැදුනි. මන්ද අප නැතිද අපේ ඕස්ට්‍රේලියානු ශ්‍රී ලාංකීය දරුවෝ අප මාතෘභූමිය ශ්‍රී ලංකාව වෙනුවෙන් යම් යුතුකම් ඉටුකිරීමට සැදී පැහැදී සිටින්නෝය යන්නයි. මෙම දූ පුතුන් අධ්‍යාපනික කටයුතු වල යෙදෙන අතරතුර, සමහර දරුවන් රැකියාවල යෙදෙන අතරවාරයේ ඔබ ඔබේම සොයුරකු වෙනුවෙන් ඔබ යොදපු කාලය ශ්‍රමය, හුදෙක්ම කළණ මිතුදම, කෘතගුණ සැලකීම, එකමුතු කම, කැපවීම ලොවටම කියා පෑවේ වැඩිහිටි අපටද ආදර්ශයක් දෙමිනි.

බොහොමයක් ප්‍රසංග පෞද්ගලික වාසි තකා ප්‍රදර්ශනය වන යුගයක ශ්‍රී ලංකාවේ මහරගම පිළිකා රෝහලේ ඉදිවෙන්නාවු ළමා සායනයට ආධාර පිණිස එළි දැක්වු මෙම ප්‍රසංගය අතිශයින්ම සාර්ථක වු බව සැලවෙන්නේ හදපිරි සතුටිනි. ඉන් රැස්වු සියලුම මුදල් සම්භාරය මහරගම පිළිකා රෝහලේ ඉදිකිරීමේ කටයුතු සඳහාමය. මෙය තුරුණු ශක්තියයි. මහෝපකාරී වු වැඩදායික වු තාරුණ්‍යයේ පිබිදීමයි.

මේ හා නන් අයුරින් කටයුතු කල දූ පුතුනි මෙය ඔබත්, ඔබේ දෙමාපිය ගුරුවරුන් සැදෑ සිතින් කරගන්නාවු මහඟු පුණ්‍ය කර්මයක් නොවන්නේද ? ඒ අන්කවරකු නිසා නොවෙයි. නුවන් පුතුනි ඔබ නිසාමය. ඒ ඔබ තුල වු හැදුනුකම, කරුණාවන්තකම කල්‍යාණ මිත්‍රත්වය, ප්‍රසන්නකම මෙන්ම පරාර්ථකාමී උතුම් ගතිපැවතුම් නිසාමය. විකසිත වීමට පෙර නටුවෙන් ගිලිහුනු මලක් මෙන් නුවන් පුතුනි ඔබ,..... නිල්වන් වු වසන්තයේ එක් මලානික වු සන්ධ්‍යාවක මිහිකත තුරුලේ

සැතපුනත්, ඔබ නැතිද
හිස් වු ඔබේ නිවහන
අඳුරු වු පංතිකාමරය
නිහඬ වු තරංගපිටිය

හුදකලාවු වේදිකාව තුරුලුකරගත ඔබේම මතකයන් යලි අවදිකරවන්න ඔබේම සොයුරු ඇතුලු ඔබේ මිතුරු මිතුරියෝ සැදී පැහැදී සිටින්නෝය. ඒ ඔබ වෙනුවෙන්මය. ඔබට තිබු ආදරය, ලෙන්ගතුකම, ගෞරවය නිසාමය. පින්බර පුතුනුවනි ඔබවෙනුවෙන් තෙත් නොවු දෙනෙතක් නැත.... සසල නොවු හදවතක් නැත..... ඔබට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනා කරමි.

**සුජීවා ලෝගුස්**

## නිසල අරණ

සියළු පිංවතුන්ගේ කාරුණික අවධානය පිණිස,

''නිසල අරණ'' (International Center For Inner Peace And Happiness Inc.) ලාභ නොලබන ආයතනයක් ලෙස :2007 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලැබේ. ''නිසල අරණ'' මගින් කිසිම ආගම් භේදයකිනුත්, ජාති භේදයකිනුත් තොරව කරගෙන යනු ලබන නිහඬ සේවයත්, විවිධ පුද්ගලයන්ගේ ජීවිත ප්‍රශ්ණ වලට ගෙනදෙනු ලබන ක්ෂණික මෙන්ම දීර්ඝ කාලීන විසඳුම්ද සැබවින්ම අගය කල යුත්තකි. ''නිසල අරණ'' මගින් සතිපතා පවත්වාගෙන යනු ලබන වැඩසටහන් අතර Dandenong Chisholm Institute of TAFE ys Room # A122 හි සෙනසුරාදා උදේ8.30 සිට සවස 4.30 දක්වා වැඩිහිටියන් සඳහා පැවත්වෙන ධර්ම සාකච්ඡා සහිත භාවනා වැඩසටහනත්, සවස 4.30 සිට 5.30 දක්වා ළමුන් සඳහා පැවත්වෙන සාකච්ඡාමය භාවනා වැඩසටහනත්, සිකුරාදා සවස 7.00 සිට 9.00 දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවත්වෙන භාවනාව හා ඒ තුලින් ජීවිතයට විසඳුම් ගෙනදෙන සාකච්ඡාමය වැඩසටහනත්, Burwood Deakin Campus හි තරුණයන් සඳහා පැවත්වෙන Youth Program එකත් ඒ අතරවේ.
''නිසල අරණේ''ඒකායන අරමුණ, කාර්ය බහුල අවිවේකී සැදැහැවතුන්ට නිහඬ හුදෙකලා, ශාන්ත පරිසරයක් තුල දවසේ තමන්ට පහසු වේලාවක පැමිණ භාවනායෝගීව ගතකිරීමට ඉඩ සලසාදීමයි. දැනට වෙසෙන ගරු බෝධිචින්තා මෑණියන්ගේ අදහස වන්නේ ඒ තුලින් මිනිසුන්ගේ මානසික ආතතිය දුරුකිරීමට අවශ්‍ය උපදෙස්ද, භාවනාමය උපදෙස්ද කිසිම ආගම්, ජාති භේදයකින් තොරව සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය හරහා නොමිලයේ සලසාදීමයි. ''නිසල අරණ''ට සම්බන්ධ මෙහෙණින් වහන්සේලාගේ ආවසය දැනට පාවිච්චි කරනු ලබන්නේ පුද්ගලික නිවහනක් සඳහා පමණි. එසේ වුවත් ඒදිනෙදා ''නිසල අරණ''ට යන එන සැදැහැවතුන්ගෙන් බාදා සිදුවන බවටත්, වාහන නවතා තැබීම සම්බන්ධයෙනුත් ''නිසල අරණ'' ට ඉදිරිපස වෙසෙන නිවැසියන්ගෙන් දැනටමත් පැමිණිලි එල්ල වී ඇත. මේ නිසා මේ ආවසයට යන එන සැදැහැවතුන්ට දැඩි අපහසුතාවයට මුහුණ දීමට සිදුව තිබෙන අතර එහි යාම ඒම සම්බන්ධ කටයුතුද සීමාකිරීමට සිදුව ඇත.

මේ ආවසයට නුදුරින් පවතින ඉඩම් කොටස මිලදී ගැනීමෙන්, ප්‍රවේශවන මාර්ග අපහසුතාව මගහරවා ගැනීමටත්, වාහන නවතා තැබීමේ පහසුවත් උදාවන අතරම, සන්සුන්, හුදකෙලා, මනසට විවේකය ගෙනදෙන වනගත අරණක අත්දැකීම ලබමින් භාවනායෝගීව විසීමට අවස්ථාවක් ලබාදීම ''නිසල අරණ'' ආයතනයේ බලාපොරොත්තුවයි. මෙම යෝජිත ඉඩම ''නිසල අරණ''ට නුදුරින් තෝරාගැනීමට හේතුවූ කරුණු කිහිපයකි. ඒ අතර ප්‍රධානම හේතුව ආවසයේ වෙසෙන මෙහෙණින් වහන්සේලාට පවතින ගොඩනැගිල්ලේම වාසයකරමින් භාවනාමය උපදෙස් හා වැඩසටහන් මෙහෙයවීමට හැකවීමය. ඒ සඳහා ගොඩනැගිල්ලක් වෙනම ඉදිකිරීමට අවශ්‍ය නොවනු ඇත. එසේම මෙම ස්ථානය පොදුගමනාගමන පහසුකම් භාවිතයෙන් පහසුවෙන් ලගාවියහැකි, සියළු පහසුකම් වලින්ද යුතු නගරබද වුවද ශාන්ත හා සන්සුන් පරිසරයකින් යුතු ස්ථානයක් වීමය. මේ ස්ථානය මෙහෙණින් වහන්සේලාගේ පුද්ගලික ආරක්ෂාව පිණිසද, ස්වභාවික විපත් වන ලැව්ගිනි ආදියෙන් තොරවූද සුදුසු ස්ථානයක් වන බව අපේ විශ්වාසයයි.

මෙම උදාර මෙහෙවර සඳහා දැනටමත් සංවිධානය කර ඇති ව්‍යාපෘති කිහිපයකි. කාරුණික පිංවතුනි, ඔබට හැකි පමණින්, පසන් සිතින් යුතුව සුළු හෝ මූල්‍යමය ආධාරයකින් මෙම මහත් ඵල මහානිශංශ ලැබෙන පිංකමට අප හා එක්වන ලෙස සැදැහැ සිතින් ආරාධනා කරමු.

''නිසල අරණ'' භාවනා මධ්‍යස්ථානය (03) 9794 0759

